අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/55/03/03 ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2023.12.13

**චක්‍රලේඛ අංකය : 47/2023**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්,
සියලුම රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්,

**<u>සමස්ත ලංකා පාසල් මුස්ලිම් සංස්කෘතික තරගය - 2024</u>**

අධ්‍යාපන අමාත්‍යාංශයේ මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව මඟින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා පාසල් මුස්ලිම් සංස්කෘතික තරගය, 2024 වසරේ සිට ආරම්භ කර වාර්ෂිකව පැවැත්වීමට කටයුතු යොදා ඇත. මේ සම්බන්ධයෙන් සියලුම පාසල් දැනුවත් කරන මෙන් දන්වමි. එසේම, මෙම තරග සඳහා පාසල් සිසුන්ට තම නිර්මාණශීලී හැකියාවන් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පහසුකම් සහ අවස්ථාවන් සලසා දීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

හැඳින්වීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව මඟින් සංවිධානය කරනු ලබන මෙම තරග තුළින් සිසුන් තුළ ඉස්ලාමීය සංස්කෘතික කලා හා සෞන්දර්ය වටිනාකම් ඇගයීමට අවස්ථාව ලබා දීම සහ කුසලතා සංවර්ධනය කිරීම අපේක්ෂා කරනු ලැබේ. ජාතික මට්ටමේ තරගවලින් ජයග්‍රාහී සිසුන් විශ්ව විද්‍යාල ප්‍රවේශයේ දී ප්‍රමුඛත්වයට පත් වේ.

ප්‍රධාන අරමුණ

1. මුස්ලිම් ආගමික, සංස්කෘතික හා සෞන්දර්ය වටිනාකම් වර්ධනය කිරීම තුළින් සිසුන්ගේ පෞරුෂයමය ගුණාංග සංවර්ධනය කිරීම හා ඒ තුළින් ජාතික හා ජාත්‍යන්තර සබඳතා තීව්‍ර කරගනිමින් යහපත් පුරවැසියකු බිහි කිරීමට දායක වීම.

අභිමතාර්ථ

1. ඉස්ලාමීය අනන්‍යතාවයට අනුකූල සෞන්දර්යාත්මක හැඟීම් ප්‍රකාශ කිරීමේ ක්‍රම භාවිත කිරීම.
2. සම්ප්‍රදායික සෞන්දර්යාත්මක හා සංස්කෘතික අගයන් ආරක්ෂා කිරීම සඳහා වන අභිප්‍රේරණය ලබා ගැනීම.
3. ඉස්ලාමීය විවිධ කලා අංග සහ භාෂා පිළිබඳ දැනුම හා කුසලතා වර්ධනය කිරීම.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

තරග කාණ්ඩ

සහභාගී වන තරගකරුවන් සඳහා ප්‍රධාන කාණ්ඩ තුනක් සහ විවෘත තරග අංශය වශයෙන් කාණ්ඩ හතරක් යටතේ තරග පැවැත්වේ.

1. කණිෂ්ඨ ද්විතීයික තරග කාණ්ඩය - 06, 07, 08 ශ්‍රේණි
2. ජ්‍යෙෂ්ඨ ද්විතීයික තරග කාණ්ඩය - 09, 10, 11 ශ්‍රේණි
3. ජ්‍යෙෂ්ඨ තරග කාණ්ඩය - 12, 13 ශ්‍රේණි
4. විවෘත තරග අංශය (වයස් කාණ්ඩ සීමා නොකෙරේ.)

2. සහභාගිත්වයට අදාළ වන කොන්දේසි

2.1. මෙම චක්‍රලේඛය කියවා තේරුම්ගෙන, ඒ පිළිබඳව තරග සඳහා සහභාගීවන සිසුන් හා තරග භාරව කටයුතු කරන ගුරුභවතුන් දැනුවත් කිරීම අදාළ පාසල් විදුහල්පතිවරුන්ගේ වගකීම වේ.

2.2. රජයේ පාසල් සිසුන්ට සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල සිසුන්ට මෙම තරගය සඳහා සහභාගී විය හැකිය.

2.3. පාසලක 06 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන සිසුන් මෙම තරගය සඳහා සුදුසුකම් ලබන අතර 2023 වසරේ උසස් පෙළ විභාගයට පළමුවර පෙනී සිටින සිසුන්ට ද තරගය සඳහා සහභාගී විය හැකිය.

2.4. උපලේඛනය 5.1 හි දක්වා ඇති තරග ඉසව් 28න් එක් පාසලකට සහභාගී විය හැක්කේ උපරිම තරග ඉසව් 14ක් සඳහා පමණි. සෑම තරගකරුවෙකුටම යම් කාණ්ඩයක කේවල තරගයකට සහ විවෘත අංශයේ එක් තරගයකට හෝ එක් කණ්ඩායම් තරගයකට, එනම් තරග දෙකකට පමණක් සහභාගී වීමේ හැකියාව ඇත.

2.5. මෙම තරගය සඳහා ඉදිරිපත් කරන ගීත වාර්ගික, ආගමික භේදවලට හෝ දේශපාලන මතවලට තුඩුදෙන පදවැල් වලින් තොර පාසල් සිසුන් සඳහා සුදුසු විය යුතු අතර ඉස්ලාමීය ආචාරධර්ම වලට ද පටහැනි නොවිය යුතුය. එසේම, කසීදා, අල් හිකායා වල් බයිත් (ගද්‍ය හා පද්‍ය), මර්හබා බයිත් (පිළිගැනීමේ ගීතය) ආදී තරග සඳහා අරාබි කවි හා ගීත ගායනා කරන විට අරාබි මූලාශ්‍රය අනුවම පැහැදිලිව උච්ඡාරණය කළ යුතුය.

2.6. තරග සඳහා ඉල්ලුම් කිරීමේ දී තරග අයදුම්පත සමඟ නෂීද්, මස්අලා (කවි ශෛලියේ සාහිත්‍ය), අල් හිකායා වල් බයිත් (ගද්‍ය හා පද්‍ය) හා විවෘත තරග වන රිටි කෙළි කලාව, අර් රක්සූර් රබානි (රබන් නර්තනය), සමාජීය නාට්‍ය හා මැලේ සංස්කෘතික වැඩසටහන යන තරඟ ඉසව් සඳහා යොදා ගන්නා ගී පද රචනා, තිර පිටපත් ස්වයං නිර්මාණ බවට විදුහල්පතිගේ අත්සනින් සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

2.7. පළාත් මට්ටමට සුදුසුකම් ලබන තරගකරුවන් තම නිර්මාණ ස්වයං නිර්මාණ බවට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර ජාතික මට්ටමට සුදුසුකම් ලබන තරගකරුවන් තම නිර්මාණ ස්වයං නිර්මාණ බවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (මුස්ලිම් පාසල් සංවර්ධන) වෙත ඉදිරිපත් කළ යුතුය.

2.8. කලාප, පළාත් හා ජාතික මට්ටමේ තරග සඳහා තරගකරුවන් පාසල් නිල ඇඳුමෙන් සැරසී සහභාගී විය යුතු අතර පාසලේ අනන්‍යතාවය ඉස්මතුවන පරිදි කිසිවක් ප්‍රදර්ශනය නොකළ යුතුය.

2.9. මස්අලා (කවි ශෛලියේ සාහිත්‍ය), අල් හිකායා වල් බයිත් (ගද්‍ය හා පද්‍ය) සහ සියලු විවෘත අංශයේ තරග සඳහා තරගකරුවන්ට සුදුසු සංස්කෘතික ඇඳුම් පැළඳුම් භාවිත කිරීමට හැකියාව පවතින අතර එම ඇඳුම් පැළඳුම් පාසල් පද්ධතියට සුදුසු විය යුතුය. ඒ පිළිබඳ සම්පූර්ණ වගකීම පාසලේ විදුහල්පති සහ භාරකාර ගුරුභවතුන් විසින් දැරිය යුතුය.

3. තරග කොන්දේසි

3.1. මෙම තරග පාසල්, කලාප, පළාත් සහ ජාතික මට්ටමින් අවස්ථා හතරක දී පැවැත්වේ. සහභාගී වන තරගකරුවන්ගේ අනන්‍යතාවය විදුහල්පති විසින් තහවුරු කළ යුතුය.

3.2. කලාප තරග සංවිධානය කරනු ලබන්නේ අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසිනි.

3.3. පළාත් තරගවල සියලුම වගකීම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරෙන අතර, මෙම චක්‍රලේඛයට අනුව නිකුත් කරන ලද සහ පළාත් තරග සම්බන්ධයෙන් ගනු ලබන අවසාන තීරණ ගැනීමේ අධිකාරී බලය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සතු වේ.

3.4. පළාත් තරග සංවිධානය කිරීම සඳහා චක්‍රලේඛයෙහි දක්වා ඇති දිනයට පෙර කලාප තරග පවත්වා තරග ප්‍රතිඵල පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.

3.5. කේවල තරගයක් සඳහා පාසල් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා එකම තරගකරුවකු පමණක් සහභාගි විය යුතුය. නොවැළැක්විය හැකි හේතුවක් මත විවෘත හෝ කණ්ඩායම් තරග සඳහා පමණක් සුදුසු සාක්ෂි මගින් ඔප්පු කළහොත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් වෙනත් තරගකරුවකු අනුමත කළ හැක. මෙය කලාප, පළාත් සහ ජාතික මට්ටමේ තරග සඳහා අදාළ වේ.

3.6. එක් තරග ඉසව්වකට සහභාගී වන තරගකරුවකු තමා මුලින් නියෝජනය කළ පාසලම ඉදිරි තරගවලදී ද නියෝජනය කළ යුතුය. එම පාසලෙන් අස්වී වෙනත් පාසලකට ඇතුළු වී ඇත්නම් ඉහත කරුණ පිළිබඳව අනිවාර්යයෙන්ම සැලකිය යුතුය.

3.7. සියලු තරග සඳහා අදාළ නියමිත කාලයට අමතරව තත්පර 30ක කාලයක් ලබා දෙනු ඇත.

3.8. කලාප හා පළාත් තරගවල දී ලකුණු සම වන අයුරින් ප්‍රතිඵල ලබා නොදිය යුතුය. පළාත් මට්ටමින් ප්‍රථම ස්ථානය ලබාගන්නා පාසල් පමණක් ජාතික මට්ටමේ තරගය සඳහා සුදුසුකම් ලබයි.

3.9. ජාතික මට්ටමේ තරගවල ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන හිමිකරගන්නා තරගකරුවන්ට විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ප්‍රමුඛතා ඇති බැවින් සියලු තරග විනිවිදභාවයකින් යුතුව චක්‍රලේඛයට අනුකූලව සිදු කෙරෙන බව කලාප සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් තහවුරු කළ යුතුය.

4. තරග පැවැත්වීම, සංවිධානය කිරීම හා තරග විනිශ්චය මණ්ඩලය පත් කිරීම

4.1. මෙම තරගය සඳහා අදාළ තරග ශීර්ෂ අධ්‍යාපන අධ්‍යක්ෂ (මුස්ලිම් පාසල් සංවර්ධන) ගේ අත්සනින් යුතුව මේ සමඟ අමුණා ඉදිරිපත් කරනු ලැබේ.

4.2. තරග සඳහා අයදුම් කිරීමේදී මෙම චක්‍රලේඛයට අමුණා ඇති අයදුම්පතට අනුව අයදුම්පත් සකස් කළ යුතුය.

4.3. පාසල් මට්ටමේ තරග 2024 මාර්තු මස 10 දින වන විට පවත්වා අවසන් කර එහි ප්‍රතිඵල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. කලාප තරග 2024 අප්‍රේල් 30 දින වන විට පවත්වා අවසන් කර එහි ප්‍රතිඵල පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද පළාත් තරග 2024 ජුනි 30 දින වන විට පවත්වා අවසන් කර එහි ප්‍රතිඵල අධ්‍යාපන අමාත්‍යාංශයේ මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද ඉදිරිපත් කළ යුතුය. පළාත් තරග ප්‍රතිඵල ලේඛණයේ පාසලේ නම නිවැරදිව සඳහන් කළ යුතුය.

4.4. ජාතික මට්ටමේ අවසන් තරගය 2024 සැප්තැම්බර් 15 දින වන විට පවත්වා අවසන් කළ යුතුය.

4.5. පාසල් හා කලාප තරග විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලය අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ද, පළාත් තරග විනිශ්චය කටයුතු සඳහා වන විනිශ්චය මණ්ඩලය අදාළ පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ද, තම කලාප/පළාත් ඉස්ලාම් හෝ සෞන්දර්ය හෝ දෙමළ මාධ්‍ය භාර නිලධාරීන්ගේ නිර්දේශ මත පත් කළ යුතුය. අවසන් තරගයේ විනිශ්චය මණ්ඩලයේ සංයුතිය තීරණය කරනු ලබනුයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාවේ සහකාර/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශයෙන් හා මුස්ලිම් පාසල් සංවර්ධන අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය මතය. එමෙන්ම යම් තරග ශීර්ෂයක විෂයානුබද්ධ ගැටළුවක් මතු වී ඇති විටෙක, ඒ පිළිබඳ යම් තීරණයක් ගත යුතු යැයි හැඟේනම් පමණක්, මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂගේ එකඟතාව මත විනිශ්චය මණ්ඩලය සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීම සිදුවේ.

5. තරග ඉසව්:

1. කිරාඅත්
2. නෂීද්
3. අදාන් කීම
4. අස්මා උල් හුස්නා
5. ෆන්නුල් හත්තිල් අරබි (අරාබි අක්ෂර කලාව)
6. අරාබි - දෙමළ සාහිත්‍ය
7. කසීදා
8. මස්අලා (කවි ශෛලියේ සාහිත්‍ය)
9. අල් හිකායා වල් බයිත් (ගද්‍ය හා පද්‍ය)
10. විවෘත තරග
    - 10.1 මර්හබා බයිත් (පිළිගැනීමේ ගීතය)
    - 10.2 රිටි කෙළි කලාව
    - 10.3 අර් රක්සූර් රබානි (රබන් නර්තනය)
    - 10.4 සමාජීය නාට්‍යය
    - 10.5 වීනාඩි ශාස්ත්‍රය
    - 10.6 මැලේ සංස්කෘතික වැඩසටහන

5.1. උපලේඛනය

| ඉසව් අංක | කාණ්ඩය | ශ්‍රේණිය | සහභාගී විය හැකි තරගකරුවන් සංඛ්‍යාව | | තරගයේ නම |
|---|---|---|---|---|---|
| 01. | 01 | 6, 7, 8 | 01 | බාලක | කිරාඅත් |
| 02. | 01 | 6, 7, 8 | 01 | බාලිකා | කිරාඅත් |
| 03. | 02 | 9, 10, 11 | 01 | බාලක | කිරාඅත් |
| 04. | 02 | 9, 10, 11 | 01 | බාලිකා | කිරාඅත් |
| 05. | 03 | 12, 13 | 01 | බාලක | කිරාඅත් |
| 06. | 03 | 12, 13 | 01 | බාලිකා | කිරාඅත් |
| 07. | 01 | 6, 7, 8 | 01 | බාලක හෝ බාලිකා | නෂීද් |
| 08. | 02 | 9, 10, 11 | 01 | බාලක හෝ බාලිකා | නෂීද් |
| 09. | 03 | 12, 13 | 01 | බාලක හෝ බාලිකා | නෂීද් |
| 10. | 02 | 9, 10, 11 | 01 | බාලක | අදාන් කීම |
| 11. | 03 | 12, 13 | 01 | බාලක | අදාන් කීම |
| 12. | 02 | 9, 10, 11 | 01 | බාලිකා | අස්මාඋල් හුස්නා |
| 13. | 03 | 12, 13 | 01 | බාලිකා | අස්මාඋල් හුස්නා |

| | | | | | |
|---|---|---|---|---|---|
| 14. | 02 | 9, 10, 11 | 01 | බාලක හෝ බාලිකා | ෆන්නුල් හත්තිල් අරබි (අරාබි අක්ෂර කලාව) |
| 15. | 03 | 12, 13 | 01 | බාලක හෝ බාලිකා | පන්නුල් හත්තිල් අරබි (අරාබි අක්ෂර කලාව) |
| 16. | 02 | 9, 10, 11 | 01 | බාලක හෝ බාලිකා | අරාබි - දෙමළ සාහිත්‍ය |
| 17. | 03 | 12, 13 | 01 | බාලක හෝ බාලිකා | අරාබි - දෙමළ සාහිත්‍ය |
| 18. | 01 | 6, 7, 8 | අවම 05 - උපරිම 07 | බාලක හෝ බාලිකා | කසීදා |
| 19. | 02 | 9, 10, 11 | අවම 05 - උපරිම 07 | බාලක හෝ බාලිකා | කසීදා |
| 20. | 03 | 12, 13 | අවම 05 - උපරිම 07 | බාලක හෝ බාලිකා | කසීදා |
| 21. | 03 | 12, 13 | 07 | බාලක | මස්අලා (කවි ශෛලියේ සාහිත්‍ය) |
| 22. | 03 | 12, 13 | අවම 05 - උපරිම 07 | බාලිකා | අල් හිකායා වල් බයිත් (ගද්‍ය හා පද්‍ය) |
| 23. | විවෘත | - | අවම 09 - උපරිම 11 | බාලක | මර්හබා බයිත් (පිළිගැනීමේ ගීතය) |
| 24. | විවෘත | - | අවම 8 - උපරිම 10 | බාලක | රිටි කෙළි කලාව |
| 25. | විවෘත | - | අවම 10 - උපරිම 12 | බාලක | අර් රක්සූර් රබානි (රබන් නර්තනය) |
| 26. | විවෘත | - | අවම 06 - උපරිම 08 | බාලිකා | සමාජීය නාට්‍යය |
| 27. | විවෘත | - | අවම 08 - උපරිම 10 | බාලක | වීනාඩි ශාස්ත්‍රය |
| 28. | විවෘත | - | අවම 08 - උපරිම 10 | බාලක හෝ බාලිකා | මැලේ සංස්කෘතික වැඩසටහන |

6. **විනිශ්චය මණ්ඩලය**

6.1 අදාළ ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් සුදුසුකම්, පළපුරුද්ද සහ ඉස්ලාමීය සංස්කෘතික දැනුමක්, පසුබිමක් හා ප්‍රවීණතා ඇති විනිශ්චය මණ්ඩලයක්, ඒ ඒ තරග අවස්ථාවන්හි දී කලාප/පළාත් හා ජාතික වටයේ තරග සංවිධායකයින් විසින් කලාප අධ්‍යාපන කාර්යාලයේ හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉස්ලාම් විෂය භාර අධ්‍යක්ෂකගේ නිර්දේශ මත පත් කෙරේ. ඒ අනුව, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස සලකනු ලැබේ. එම තීරණය පිළිබඳ තරග සංවිධායකවරුන් විසින් කිසිදු මැදිහත්වීමක් සිදු කරනු නොලැබේ.

7. පැමිණිලි හා අභියාචනා

7.1 තරඟ සම්බන්ධයෙන් දෙමාපියන්, දේශපාලඥයින් හෝ පාසලෙන් බාහිර පාර්ශවයන්හි, සුබපතන්නන්ගේ සහ ආදි ශිෂ්‍ය සංගම් ආදියෙහි මැදිහත්වීම් සිදු නොකළ යුතු අතර ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගනු නොලැබේ.

7.2 චක්‍රලේඛයට හෝ ඇමුණුමට පට හැනිව තරඟ එකක් හෝ කිහිපයක් පවත්වන්නේ නම් හෝ තරඟ ක්‍රියා පටිපාටියේ කිසියම් ගැටලුවක් මතුවේ නම්,

7.2.1 කලාප මට්ටමේ තරගවලදී පාසල් විදුහල්පති හෝ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද පළාත් මට්ටමේ තරග වලදී කලාප තරග සම්බන්ධීකාරක හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත, තරග ප්‍රතිඵල ප්‍රකාශ කිරීමට ප්‍රථම පැමිණිල්ල ලිඛිතව අදාළ සාක්ෂි ද සමග ඉදිරිපත් කළ යුතුයි.

7.2.2 ජාතික මට්ටමේ තරග වලදී පළාත් තරග සම්බන්ධීකාරක විසින් හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ප්‍රතිඵල ප්‍රකාශ කිරීමට ප්‍රථම තරග කාර්යාලයේ ප්‍රධාන සංවිධායක වෙත පැමිණිල්ල ලිඛිතව අදාළ සාක්ෂි ද සමග ඉදිරිපත් කළ යුතුයි.

7.3 තරග පටිපාටියේ යම් ගැටලුවක් පවතීනම් පමණක් ඒ පිළිබඳ අවධානය යොමු කෙරෙනු ඇත.

8. සහතිකපත්‍ර ප්‍රදානය කිරීම

8.1 පාසල්, කලාප සහ පළාත් මට්ටමින් ජයග්‍රහණය කරන සිසුන් සඳහා සහතිකපත්‍ර ප්‍රදානය කෙරේ. මෙම කටයුතු ඒ ඒ පාසල/කලාප/පළාත විසින් සංවිධානය කළ යුතුයි.

8.2 ජාතික මට්ටමින් ජයග්‍රහණය කරන සිසුන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සහතිකපත්‍ර ප්‍රදානය කෙරේ.

8.3 තරග සඳහා සහභාගී වන සියලුම තරගකරුවන් සහ අදාළ පාර්ශවකරුවන් සෑම අවස්ථාවකදීම මෙම චක්‍රලේඛයෙහි සඳහන් නීති රීති අනුගමනය කළයුතු අතර විනිසුරුවරුන්ගේ තීරණ අවසාන තීරණය ලෙස පිළිගත යුතුය.

ජාතික මට්ටමේ අවසන් තරග සඳහා සුදුසුකම් ලබා සහභාගී වන පාසල්, තරග කාලසටහනේ ඇමුණුම හොඳින් කියවා බලා තේරුම් ගතයුතු අතර නියමිත පරිදි විදුහල්පතිගේ අත්සන ලබා තරගය සඳහා සහභාගී විය යුතුය. මෙම චක්‍රලේඛයේ සඳහන් තරග නීති උල්ලංඝනය කිරීම පිළිබඳ තහවුරු වුවහොත් එය සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතුය.

එම්. එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

## තරඟ ඉසව්

1. **කිරාඅත් : බාලක, බාලිකා (කේවල)**

   **තරග කාණ්ඩ :**

   - **කණිෂ්ඨ ද්විතීයික තරග කාණ්ඩය (06, 07, 08 ශ්‍රේණි)**

     අල් - කුර්ආණයේ සූරා අල් - මුල්ක්, සූරා අල් - ජුම්ආ, සූරා අර් - රහ්මාන් යන සූරා අතරින් විනිසුරුවරුන් ඉදිරියේ තරගකරුවන් විසින් තෝරාගනු ලබන එක් සූරාවක ප්‍රථම වාක්‍යයේ සිට වාක්‍ය පහළොවක් (15) පාරායනා කළ යුතුයි.

     **කාලය : විනාඩි 08 - 10**

   - **ජ්‍යෙෂ්ඨ ද්විතීයික තරග කාණ්ඩය (09, 10, 11 ශ්‍රේණි)**

     අල් - කුර්ආණයේ සූරා යාසීන්, සූරා අස් - සජදා, සූරා අල් - කහ්ෆ් යන සූරා අතරින් විනිසුරුවරුන් ඉදිරියේ තරගකරුවන් විසින් තෝරාගනු ලබන එක් සූරාවකින් වාක්‍ය විස්සක් (20) පාරායනා කළ යුතුයි.

     **කාලය : විනාඩි 10 -12**

   - **ජ්‍යෙෂ්ඨ තරග කාණ්ඩය (12, 13 ශ්‍රේණි)**

     අල් - කුර්ආණයේ සූරා අල් - අන්ආම්, සූරා ආලුඉම්රාන්, සූරා අල් - බකරා යන සූරා අතරින් විනිසුරුවරුන් ඉදිරියේ තරගකරුවන් විසින් තෝරාගනු ලබන එක් සූරාවක වාක්‍ය විසිපහක් (25) පාරායනා කළ යුතුයි.

     **කාලය : විනාඩි 12 - 15**

   **තරග කොන්දේසි :**

   - අල් - කුර්ආණය බලා තජ්වීද් නීතිවලට අනුකූලව හා ස්වරානුකූලව පාරායනය කළ යුතුයි.
   - බාලක හා බාලිකා අංශ සඳහා වෙන වෙනම තරග පැවැත්විය යුතුයි.
   - කලාප සිට ජාතික මට්ටම දක්වා තරගකරු පාසල් නිල ඇඳුමෙන් සහභාගි විය යුතුයි.

   **ලකුණු ලබා දීමේ පිළිවෙළ : කිරාඅත් (කේවල)**

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | තජ්වීද් ක්‍රමයට පාරායනය කිරීම | 30 |
| 02 | මහ්රජ් (නිවැරදි උච්ඡාරණය) | 30 |
| 03 | කටහඬ හා ස්වරානුකූලභාවය | 15 |
| 04 | මකාමත් (ස්ථානගත වීම) | 10 |
| 05 | ආරෝහණ අවරෝහණ රටාව | 10 |
| 06 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

2. **නෂීද් (ගායනය) : බාලක හෝ බාලිකා (කේවල)**

   තරග කාණ්ඩ :

   - කණිෂ්ඨ ද්විතීයික තරග කාණ්ඩය (06, 07, 08 ශ්‍රේණි)

     මාතෘකාව : තරු අහස

     කාලය : විනාඩි 03 – 04

   - ජ්‍යෙෂ්ඨ ද්විතීයික තරග කාණ්ඩය (9, 10, 11 ශ්‍රේණි)

     මාතෘකාව : සලාතයේ මහිමය

     කාලය : විනාඩි 04 – 05

   - ජ්‍යෙෂ්ඨ තරග කාණ්ඩය (12, 13 ශ්‍රේණි)

     මාතෘකාව : වනිතා අභිමානය

     කාලය : විනාඩි 05 - 06

තරග කොන්දේසි :

- ස්වභාවධර්මය, ඉස්ලාමීය ඉගැන්වීම් හා සංස්කෘතික කරුණු පිළිබිඹු වන ගීත විය යුතුයි.
- ලබා දී ඇති මාතෘකාවට අදාළ ගීතය තමා විසින්ම දෙමළ මාධ්‍යයෙන් නිර්මාණය කරගෙන සංගීත උපාංගයන්ගෙන් තොරව ගායනය කළ යුතුයි.
- සිනමා ගීත අනුකරණ නොකළ යුතුයි.
- එක් කාණ්ඩයකින් සහභාගී විය හැක්කේ එක් තරඟකරුවෙකුට පමණි.
- බාලක සහ බාලිකා තරග එකම ඉසව්වක් ලෙස පැවැත්විය යුතුයි.
- තරග කරන අවස්ථාවේදී නිර්මාණ පිටපත තරග සංවිධායකට ලබා දිය යුතුයි.
- කලාප සිට ජාතික මට්ටම දක්වා සහභාගීවන තරගකරුවන් පාසල් නිල ඇඳුමෙන් සහභාගි විය යුතුයි.

ලකුණු ලබා දීමේ පිළිවෙළ : නෂීද් (කේවල)

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | අදහස් ඉදිරිපත් වීම හා එහි අර්ථවත් බව | 30 |
| 02 | හැඟීම් ප්‍රකාශ වීම | 20 |
| 03 | කටහඬ හා ස්වර | 25 |
| 04 | උච්චාරණය හා පැහැදිලි බව | 10 |
| 05 | උපාය මාර්ග | 10 |
| 06 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

3. අදාන් කීම : බාලක (කේවල)
මස්ජිදයේ පස්වේල් සලාතය ඉටුකිරීම සඳහා කැඳවීමට මුඅද්දීන් (අදාන් පවසන ආකාරයට) ශබ්ද නගා පැවසීම.

තරග කාණ්ඩ :

- **ජ්‍යෙෂ්ඨ ද්විතීයික තරග කාණ්ඩය (9, 10, 11 ශ්‍රේණි)**
  අදාන් පැහැදිළිව පැවසිය යුතුයි.
  කාලය : විනාඩි 04
- **ජ්‍යෙෂ්ඨ තරග කාණ්ඩය (12, 13 ශ්‍රේණි)**
  අදාන් හා දූආව පැහැදිළිව පැවසිය යුතුයි.

  <u>අදාන් දූආ</u>
  අල්ලාහුම්ම රබ්බ හාදිහිද් - දෑවතිත් තාම්මති
  වස්සලාතිල් කාඉමති, ආති මුහම්මදනිල්
  වසීලත වල්-ෆලීලත වබ්අස්හු
  මකාමන් මහ්මූදනිල්ලදී ව අත්තහු
  (සහීහුල් බුහාරි : 614)

  කාලය : විනාඩි 04 – 05

තරග කොන්දේසි :

- අරාබි භාෂා උච්ඡාරණය පැහැදිලිව තිබිය යුතුයි.
- එක් කාණ්ඩයකින් සහභාගී විය හැක්කේ එක් තරගකරුවෙකුට පමණි.
- කලාප සිට ජාතික මට්ටම දක්වා තරගකරු පාසල් නිල ඇඳුමෙන් සහභාගී විය යුතුයි.

ලකුණු ලබා දීමේ පිළිවෙළ : අදාන් කීම

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | මතක තබා ගැනීමේ හැකියාව | 30 |
| 02 | ශබ්දය හා හැඟීම් | 25 |
| 03 | මහ්රජ් (නිවැරදි උච්ඡාරණය හා ස්වරය) | 25 |
| 04 | මකාමත් (ස්ථානගත වීම) | 15 |
| 05 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

4. අස්මා උල් හුස්නා : බාලිකා (කේවල)

තරග කාණ්ඩ :

- ජ්‍යෙෂ්ඨ ද්වීතියික තරග කාණ්ඩය (9, 10, 11 ශ්‍රේණි)
  අස්මා උල් හුස්නා තාලය සමඟ ගායනා කළ යුතුයි.
  කාලය : විනාඩි 06 - 07
- ජ්‍යෙෂ්ඨ තරග කාණ්ඩය (12, 13 ශ්‍රේණි)
  අස්මා උල් හුස්නා දෙමළ භාෂාවෙන් තේරුම් සමඟ ගායනා කළ යුතුයි.
  කාලය : විනාඩි 07 - 09

තරග කොන්දේසි :

- අරාබි භාෂා උච්ඡාරණය පැහැදිලිව තිබිය යුතුයි.
- එක් කාණ්ඩයකින් සහභාගී විය හැක්කේ එක් තරගකරුවෙකුට පමණි.
- සෘතියට අනුව සංගීත උපාංගයන්ගෙන් තොරව ගායනය කළ යුතුවේ.
- කලාප සිට ජාතික මට්ටම දක්වා තරගකරු පාසල් නිල ඇඳුමෙන් සහභාගී විය යුතුයි.

ලකුණු ලබා දීමේ පිළිවෙළ : අස්මා උල් හුස්නා

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | මතක තබා ගැනීමේ හැකියාව | 30 |
| 02 | ශබ්දය හා හැඟීම් | 25 |
| 03 | මහ්රජ් (නිවැරදි උච්ඡාරණය හා ස්වරය) | 25 |
| 04 | මකාමත් (ස්ථානගත වීම) | 15 |
| 05 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

5. ෆන්නුල් හත්තිල් අරබි (අරාබි අක්ෂර කලාව/ඇඳීම) : බාලක හෝ බාලිකා (කේවල)

තරග කාණ්ඩ :

- ජ්‍යෙෂ්ඨ ද්විතියික තරග කාණ්ඩය (9, 10, 11 ශ්‍රේණි)
  මාතෘකාව : "ලාඉලාහ ඉල්ලල්ලාහ්" නම් අරාබි වාක්‍ය
  කාලය : පැය 3 යි
- ජ්‍යෙෂ්ඨ තරග කාණ්ඩය (12, 13 ශ්‍රේණි)
  මාතෘකාව : "බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්" නම් අරාබි වාක්‍ය
  කාලය : පැය 3 යි

තරග කොන්දේසි :

- එක් බාණ්ඩයකින් සහභාගි විය හැක්කේ එක් තරගකරුවෙකුට පමණි.
- බාලක සහ බාලිකා තරග එකම ඉසව්වක් ලෙස පැවැත්විය යුතුයි.
- 64 cm x 51 cm ප්‍රමාණයේ සුදු පැහැති Bristol Board හි කලුපාට තීන්ත වලින් ඇදීම කළ යුතුයි.
- සත්ව රූප ඇදීමෙන් වැළකිය යුතුයි.
- කලාප සිට ජාතික මට්ටම දක්වා තරගකරු පාසල් නිල ඇඳුමෙන් සහභාගි විය යුතුයි.

ලකුණු ලබා දීමේ පිළිවෙළ : ෆන්නුල් හත්තිල් අරබි (අරාබි අක්ෂර කලාව)

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | ක්‍රමවත් අරාබි අක්ෂර | 20 |
| 02 | අක්ෂර කලා | 30 |
| 03 | වර්ණ භාවිතය හා තාක්ෂණය | 25 |
| 04 | සෞන්දර්යාත්මක භාවය | 15 |
| 05 | සම්පූර්ණත්වය හා ක්‍රමවත් බව | 10 |
| | එකතුව | 100 |

6. අරාබි - දෙමළ සාහිත්‍ය : බාලක හෝ බාලිකා (කේවල)

තරග කාණ්ඩ :

- **ජ්‍යෙෂ්ඨ ද්විතීයික තරග කාණ්ඩය (9, 10, 11 ශ්‍රේණි)**

  **මාතෘකාව :** තලෛ පාත්තිහා

  1. "අල්ලාහුම්මසල්ලි අලා මුහම්මද්
     යාරබ්බි සල්ලි අලෛහිවසල්ලිම්
     පී බුද්ඉ තලෛපාතිහල් මුනල්ළම්" යන 1 වැනි බයිත්හි (පද වැල් 46යි)

  2. "මර්හබා යා මර්හබා මර්හබා උම්මල් හුසෛනි
     මර්හබා යා මර්හබා මර්හබා කුර්රත අයිනි
     අප්ආ ලස් සිපාති ස්සාති අඩිමෛයා මුන් තන්නයි" යන 6 වැනි බයිත්හි (පද වැල් 34යි)

  **කාලය :** විනාඩි 07 – 08

- **ජ්‍යෙෂ්ඨ තරග කාණ්ඩය** (12, 13 ශ්‍රේණි)

  **මාතෘකාව :** තලෛ පාත්තිහා

  1. "යාකුර්රතුල් මුස්තෆා සහ්රා රලියල්ලාහු අන්කි
     යා දුර්රතන් නිස්වා නිහ්පර්නා ඉලල්ලාහි යාකුර්රති
     මාදර්හල් නායහි මා කදීජා පෙරුමානේ එංගල්" (නිලෙයි පාතිහා - පද වැල් 50යි.)

  2. " මව්ලාය සල්ලි වසල් ලිම්දා ඉ මන්අබදා
     අලා හබීබික හෛරිල් හල්කි කුල්ලිහිම්
     අල්ලාහ්වින් නාමම් කොන්ඩෝම් අවන් තන් පුහල්ච්චි කොන්ඩෝම්" යන 2 වැනි බයිත් (පද වැල් 44යි.)

  **කාලය :** විනාඩි 08 - 09

ඉහත කොටස් "ආරාබි දෙමළෙන්" දෙනු ලැබේ. මේ අතරින් විනිසුරුවරුන් ඉදිරියේ තරඟකරුවන් විසින් තෝරගනු ලබන තම තරග කාණ්ඩයට අදාළ අරාබි දෙමළ කොටස කියවා, ඉන් පසු එය ගැළපෙන අයුරින් ගායනා කළ යුතුයි.

තරග කොන්දේසි :

- එක් තරග කාණ්ඩයකින් සහභාගි විය හැක්කේ එක් තරගකරුවෙකුට පමණි.
- බාලක සහ බාලිකා තරග එකම ඉසව්වක් ලෙස පැවැත්විය යුතුයි.
- සංගීත භාණ්ඩ භාවිත කළ නොහැක.
- කලාප සිට ජාතික මට්ටම දක්වා තරගකරුවන් පාසල් නිල ඇඳුමෙන් සහභාගි විය යුතුයි.

ලකුණු ලබා දීමේ පිළිවෙළ : අරාබි - දෙමළ සාහිත්‍ය

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | කියවීමේ හැකියාව | 25 |
| 02 | උච්චාරණය හා හැඟීම් | 20 |
| 03 | ගායන හැකියාව | 20 |
| 04 | ප්‍රකාශනය සහ ඉරියව් | 10 |
| 05 | ස්වරය | 10 |
| 06 | ආරෝහණ අවරෝහණ රටාව | 10 |
| 07 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

7. කසීදා : බාලක හෝ බාලිකා (කණ්ඩායම්)
තරග කාණ්ඩ :

- **කණිෂ්ඨ ද්විතීයික තරග කාණ්ඩය** (06, 07, 08 ශ්‍රේණි)
  **මාතෘකාව : සුබ්හාන මව්ලිදු**
  **සහභාගී වියහැකි තරගකරුවන් සංඛ්‍යාව :** අවම 5 - උපරිම 7
  **කාලය** : විනාඩි 03 - 04

  අල් හම්දු ලිල්ලාහිල්ලදී ඈතානි
  හාදල් උලාමත් තෛයියිබල් අර්දානි
  කද්සාද පිල් මහ්දි අලල් ඉල්මානි
  උර්දූහු බිල්ලාහි දි ස්සුල්තානි
  හත්තා අරාහු බාලි අල් බයානි
  උර්දූහු මින් ශර්රි දී ශන්ආනි
  මින් හාසිදින් මුල්තරිමිල් අය්නානි
  අන්තල්ලදී සුම්මීත පිල් කුර්ආනි
  අහ්මද මක්තූබන් අලල් ජිනානි
  සල්ලා අලයිකල්ලාහු පිල් අහ්යානි
  අහ්මදූහු පිස්සිර්රි වල් ඉෑලානි
  හක්කන් අලල් ඉස්ලාම් වල් ඊමානි
  සල්ලා අලෛක කාලිකුල් ජිනානි
  මා දාම අබදුර්රහ්මතිර් රහ්මානි

- **ජ්‍යෙෂ්ඨ ද්විතීයික තරග කාණ්ඩය** (9, 10, 11 ශ්‍රේණි)
  **මාතෘකාව : යා වජීහිද් දිනී**
  **සහභාගී විය හැකි තරගකරුවන් සංඛ්‍යාව** : අවම 05 - උපරිම 07
  **කාලය** : විනාඩි 04 - 05

  යා වජීහිද් දිනී වල් කරමි
  වහලිෆල් ඉල්මී වල් හිකමි
  නබීයුන් නබීයුන් නබීයුන් නබී //

  යාරසුල් අල්ලාහි සලාමුන් අලයික්
  යා රෆී ආ....ෂානි වා ධරජී
  රසූලුන් රසූලුන් රසූලුන් රසූල් //

  යා වෆියල් අහදි වස් දීමාමි
  වහමී දස් ෂායායී වෂ් ෂායාමි
  අමීනුන් අමීනුන් අමීනුන් අමීනුන්...//

  යරසූල් අල්ලාහියා ඉම්දතනා
  ය ඉමාමල් අම්බියා ඉල් උමනා
  හාතිමුන් හාතිමුන් හාතිමුන් හාතිමු...//

  වල් ෆකීදිල් මහ් දි මුෘතරිඉන්
  මින්හු බිල් ඉෆ්ලාසි වල් අදමි
  රහීමුන් රහීමුන් රහීමුන් රහීම්...//

  අයිර අන්නල් ෆල් ළ මුෘතකදුන්
  මින් අලීමිල් ෆල් ළි වල් කරමි
  කරීමූන් කරීමූන් කරීමූන් කරීම්... //

  ව සලාතුල්ලාහි කාලිකිනා
  තතගාෂ්-ෂා සයිදිල් උමමී
  මුස්තෆා මුස්තෆා මුස්තෆා මුස්තෆා //

  අහ්මදල් මුක්තාරි සෙයි යිදුනා
  අද්දිල් අවුරාකි වද් දියමී
  කාමිලුන් කාමිලුන් කාමිලුන් කාමිලුන් //

  **ගායනය : වහීඩ් සෆර් ක්වාස්මි**

- **ජ්‍යෙෂ්ඨ තරග කාණ්ඩය** (12, 13 ශ්‍රේණි)
  **මාතෘකාව : යා තයිබා යා තයිබා**
  **සහභාගී විය හැකි තරගකරුවන් සංඛ්‍යාව** : අවම 05 - උපරිම 07
  **කාලය** : විනාඩි 05 - 06

  යා තයිබා යා තයිබා යා ද වල් ඉයානා
  ස්තික්නා ලි විල් හවා නා දානා
  (යා තයිබා යා තයිබා)
  ලම්මා සාරල් මර්කබු නසාන්
  සාරු වද් -දම්ඉ මා ජෆානි
  අහදූ කල්බී මඅ ජිනානි
  යා තයිබා යංතීමල් විල්හානා
  යංතීමල් විල්හානා
  (යා තයිබා යා තයිබා)

කිබ්ලතී බයිතුල්ලාහි සාබීර්
අල්ලනී යච්මන් ලකී සාඉර්
යා තුරා හල් කරානි නාලිර්
ලිල් කංබති වතුංමූර්නි බී අමානා
වතුංමූර්නි බී අමානා
(යා තයිබා යා තයිබා)
නබීනා අංලා උම්නියියා තී
අසුරුක ලව් මර්රතන් බපී හයාති
ව බිජවාරික සල්ලා සලාති
වස්කුර් රඹ්බී වතුලුල් කුර්ආනා
වතුලුල් කුර්ආනා
(යා තයිබා යා තයිබා)
බුෂ්රාකල් මදීනා බුෂ්රාකි
බී කුදූමිල් හාදි යා බුෂ්රාකි
ෆ හල්ලී මංවාපී හිමාකි
අතමල්ලා......පන්නූරු සබානා
නුරුකුම් සබානා
(යා තයිබා යා තයිබා)

ගායනය : අයිෂා අබ්දුල් බාසිත්

තරග කොන්දේසි :

- එක් පාසලකින් බාලක හෝ බාලිකා එක් කණ්ඩායමක් පමණක් සහභාගි විය හැකිය.
- බාලක සහ බාලිකා තරග එකම ඉසව්වක් ලෙස පැවැත්විය යුතුයි.
- ඒ ඒ කාණ්ඩයට අදාළ කසීදා අරාබි භාෂාවෙන් පමණක් ගායනය කළ යුතු වේ.
- අරාබි භාෂා උච්ඡාරණය ඉතා පැහැදිලි විය යුතුයි.
- සංගීත භාණ්ඩ භාවිත කළ නොහැක.
- තරගකරුවන් සිටගෙන හෝ අසුන්ගෙන හෝ ඇවිදීමෙන් හෝ ඉදිරිපත් කිරීම කළ හැකිය.
- කලාප සිට ජාතික මට්ටම දක්වා තරගකරුවන් පාසල් නිල ඇඳුමෙන් සහභාගි විය යුතුයි.

ලකුණු ලබා දීමේ පිළිවෙළ : කසීදා

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | නිවැරදි උච්ඡාරණය | 25 |
| 02 | කටහඬ හා ස්වරය | 25 |
| 03 | හැඟීම් | 15 |
| 04 | තාලය හා උපාය | 15 |
| 05 | කණ්ඩායම් ඒකාග්‍රතාව | 15 |
| 06 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

8. **මස්අලා (කවි ශෛලියේ සාහිත්‍ය) : බාලක (කණ්ඩායම්)**

තරග කාණ්ඩ : ජ්‍යෙෂ්ඨ තරග කාණ්ඩය (12, 13 ශ්‍රේණි)
මාතෘකාව : "නුබුවත්"
තේමාවට අදාළ වන පරිදි නව ආරයෙන් යුක්තව ප්‍රශ්න ඉදිරිපත් කිරීම හා ඒ සඳහා පිළිතුරු ලබාදීම. (දෙමළ මාධ්‍යයෙන්)
සහභාගී විය හැකි තරගකරුවන් සංඛ්‍යාව : 07
කාලය : විනාඩි 08 - 10

වැඩසටහන් විස්තරය :

- උස්තාද් (ගුරුවරයා) හා තුල්ලාබ්ලා (ශිෂ්‍යයින්) කණ්ඩායම් ලෙස අසුන්ගෙන සිටී. උස්තාද් මැදින්ද තුල්ලාබ්ලා දකුණ හා වම් පසින් තිදෙනා බැගින් ද වාඩිවේ.
- උස්තාද් පකීර්වරු භාවිතා කරන විශාල පකීර් රබානක් හා තුල්ලාබ්ලා කුඩා අත් රබානක් හා කෙවිටක් භාවිතා කරයි.
- තේමාවට ගැළපෙන පරිදි උස්තාද් ප්‍රහේලිකාවක් ලෙස යම් ප්‍රවෘත්තියක් ඉදිරිපත් කරන අතර, ඒ සම්බන්ධයෙන් පුදුමයෙන් හා හාස්‍යයෙන් තුල්ලාබ්ලා ප්‍රහේලිකා ලෙස ප්‍රශ්න අසයි. එයට උස්තාද් පද්‍යයෙන් හා ගද්‍යයෙන් පිළිතුරු ලබා දේ.
- ගැලපෙන සෑම අවස්ථාවකම උස්තාද් හා තුල්ලාබ්ලා රබාන භාවිතා කරයි.
- අවශ්‍ය අවස්ථාවලදී පමණක් උස්තාද් හා තුල්ලාබ්ලා එක්ව ගායනයේ යෙදිය හැකිය.

තරග කොන්දේසි :

- පාරම්පරික සංස්කෘතීන් අනුගමනය කළ යුතුයි.
- ගායනය හා ඇඳුම් ඉස්ලාමීය සංස්කෘතියට අනුකූල විය යුතුයි.
- සිනමා ගීත අනුකරණය නොකළ යුතුයි.
- තරග කරන අවස්ථාවේ නිර්මාණයේ පිටපත තරග සංවිධායකට ලබාදිය යුතුයි.

**ලකුණු ලබා දීමේ පිළිවෙළ : මස්අලා (කවි ශෛලියේ සාහිත්‍ය)**

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | අදහස් ප්‍රකාශවීම හා එහි අර්ථවත් බව | 30 |
| 02 | චරිත නිර්මාණය හා හැඟීම් ප්‍රකාශ කිරීම | 20 |
| 03 | සභය ගායනයේ ගැලපීම හා හාස්‍යජනක බව | 20 |
| 04 | නායකත්වය හා කණ්ඩායම් ඒකාග්‍රතාවය | 15 |
| 05 | ඇඳුම්/උපාය | 10 |
| 06 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

9. **අල් හිකායා වල් බයිත් (ගද්‍ය හා පද්‍ය) : බාලිකා (කණ්ඩායම්)**
**තරග කාණ්ඩය : ජ්‍යෙෂ්ඨ තරග කාණ්ඩය** (12, 13 ශ්‍රේණි)

**මාතෘකාව** : "අල් ඉස්රා වල් මිහ්රාජ්" (රාත්‍රී ගමන සහ දෙව්ලොව ගමන )
ඉස්ලාමීය ඉතිහාසයේ සිදුවීම් "අල් ඉස්රා වල් මිහිරාජ්" බයිත් ලෙස ඉදිරිපත් කර එයට අවශ්‍ය පැහැදිලි කිරීම් ගද්‍ය ලෙස ඉදිරිපත් කිරීම.

**සහභාගී විය හැකි තරගකරුවන් සංඛ්‍යාව :** අවම 05 - උපරිම 07

**කාලය** : විනාඩි 08 – 10

තරග කොන්දේසි :

- තේමාවට ගැළපෙන "බයිත්" (ගද්‍ය) අරාබි භාෂාවෙන් හා හිකායත් (පද්‍ය) දෙමළ භාෂාවෙන් ස්වයං නිර්මාණය විය යුතුයි.
- බයිත් (ගද්‍ය) කණ්ඩායම් ලෙස ඉදිරිපත් කළ යුතු අතර ඒ සඳහා වන "හිකායත්" (පද්‍ය) තනි තනියෙන් ඉදිරිපත් කළ යුතුයි.
- "බයිත්" සහ "හිකායත්" යන දෙකම සජීවී බවකින් යුක්තව හා හැඟීම්බරව ඉදිරිපත් කළ යුතුයි.
- අරාබි භාෂා උච්චාරණය ඉතා පැහැදිලි විය යුතුයි.

- සංගීත භාණ්ඩ ලෙස එක් පකීර් රබානක් පමණක් භාවිත කළ හැකිය.
- ඉස්ලාමීය සම්ප්‍රදායන්ට ගැළපෙන ඇඳුම් හා ආභරණ පැළඳිය යුතුයි.
- තරග කරන අවස්ථාවේ නිර්මාණයේ පිටපත තරග සංවිධායකට ලබාදිය යුතුයි.

**ලකුණු ලබා දීමේ පිළිවෙළ : අල් හිකායා වල් බයිත් (ගද්‍ය හා පද්‍ය)**

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | අදහස් ප්‍රකාශවීම හා එහි අර්ථවත් බව | 25 |
| 02 | නිර්මාණාත්මක හැකියාව හා හැඟීම්බර ඉදිරිපත් කිරීම | 25 |
| 03 | රාග තාල හා නිවැරදි උච්ඡාරණය | 25 |
| 04 | කණ්ඩායම් ඒකාග්‍රතාවය | 15 |
| 05 | ඇඳුම් /උපාය | 05 |
| 06 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

<u>විවෘත තරග</u>

10. **මර්හබා බයිත් (පිළිගැනීමේ ගීතය) : බාලක (කණ්ඩායම්)**

**මාතෘකාව** : විවාහ උත්සවයකදී මනමාලයා මගුල් පෝරුවට කැඳවාගෙන යන අවස්ථාවේ හෝ යම් උත්සවයකදී ආරාධිත අමුත්තන් වේදිකාවට කැඳවාගෙන යන අවස්ථාවේ ගායනා කරන පිළිගැනීමේ ගීතයක්.

**සහභාගී විය හැකි තරගකරුවන් සංඛ්‍යාව** : අවම 09 - උපරිම 11

**කාලය** : විනාඩි 08 – 10

**1.** <u>මව්ලිදුල් හරීර්</u>

තල අල් - බද්රු අලයිනා
මින් සනිය්යාතිල් විදාඉ
වජබශ් ශුක්රු අලයිනා
ම දආ ලිල්ලාහි දාඉ

අය්යුහල් මබ්ඌසු පීනා
ජිඃත බිල් අම්රිල් මුතාඉ
කද් ලබිස්නා සව්බ ඉස්සින්
බෑද තල්පිකීර් රිකාඉ

අන්ත හීල් කුල්ලි ජමීලුන්
වජමාලුන්යා මුතාඉ
වර ලෑනා-සද්යවස්ලින්
කබ්ල අය්යාමිර් රලාඉ
රබ්බනා සල්ලි අලා මන්

හල්ල හී කය්රිල් බිකාඉ
වඅලා ආලිම් වසහ්බි
මාසආ ලිල්ලාහි සාඉ
වස්බිලිස් සිත්ර අලෛනා
යාමුජිබන් කුල්ලදාඉ

## 2. <u>මව්ලිදූ සුභදායිල් බද්රියින්</u>

අස්සුබුහු බදා මින් තල් අතිහි
වල්ලයිලූ දජා ලි වෆ් රතිහි
ෆාකර් රසූලා ෆළ්..ළන් වඅලා
අහ්දස් සුබුලා ලිදලාලතිහි
කන්සූzල් කරමි මව්ලින් නිඅමි
හාදිල් උමමි ලිකර්අතිහි
අස්zකන් නසබි ඇලල් හසබි
කුල්ලුල් අරබි පී හිද්මතිහි
සඅතිශ් ශජරු නතකල් හජරු
ශක්කල් කමරු බි ඉෂාරතිහි
ජිබ්රීලු අතා ලයිලත ඉස්රා
වර්-රබ්බූ ද ආ හු ලි හල්රතිහි
නාලෂ්-ෂරපා වල්ලාහු අෆා
අම්මාසලෆා මින් උම්මතිහි
නාලෂ් - ෂරපා වල්ලාහු අෆා
අම්මාසලපා මින් උම්මතිහි
වමුහම්මදූනා හුව සෙයිදූනා
ෆිල් ඉස්සූ ලනා ලි ඉජාබතිහි
වඅලෛහි සලාතුල්ලාහි වලා
ආලිම් වඅලා බද්රියියතිහි

## 3. <u>සුබ්හාන මව්ලිදූ</u>

යා නබි සලාම් අලෛකුම්.
යා රසූල් සලාම් අලෛකුම්
යාහබීබ් සලාම් අලෛකුම්
සලවාතුල්ලාහි අලෛකුම්.

අෂ්රකල් බද්රු අලෛනා
ෆහ්දපත් මින්හුල් බුදූරු.
මිස්ල හුස්නික මාරඅයිනා
කත්තුයා වජිහස්සුරූරි
(යා නබි)

යාහබීබි යා මුහම්මද්
යා අරූසල් හාබිකයිනි
යාමුඅයියද් යාමුමජ්ජද්
යාඉමාමල් කිබ්ලතයිනි
(යා නබි)

මාන් රආ වජ්හක යස්අද්
යා කරිමල් වාලිදයිනි
රබ්බි ඉර්හම්නා ජමීඅන්
බීජමිස් සාලිහාති.
(යා නබි)

4. <u>තලෛපාතිහා</u>

ලාඉලාහ ඉල්ලල්ලාහු
ලාඉලාහ ඉල්ලල්ලාහ්
ලාඉලාහ ඉල්ලල්ලාහු
මුහම්මදුර් රසූලුල්ලාහ්

උද්දතී සලාම් අලෛකි
උම්දතී සලාම් අලෛකි
උස්වතී සලාම් අලෛකි
ෆාතිමා සලාම් අලෛකි
(ලාඉලාහ)

මර්හබා උම්මුල් හුසෛනි
මර්හබා උම්මුල් හසනි
මර්හබා කුර්රත අය්නි
ෆාතිමා සලාම් අලෛකි.
(ලාඉලාහ)

මර්හබා බින්තර් රසූලි
මර්හබා සව්ජති අලිය්යි
මර්හබා සයියිදතුන් නිසාඉ
ෆාතිමා සලාම් අලෛකි
(ලාඉලාහ)

සල්ලල්ලාහු අලා මුහම්මද්
සල්ලල්ලාහු අලෛහි වසල්ලම්.
සල්ලල්ලාහු අලා මුහම්මද්
සල්ලල්ලාහු අලෛහි වසල්ලම්.
සල්ලල්ලාහු අලා මුහම්මද්
යාරබ්බි සල්ලි අලෛහි වසල්ලිම්.

**තරඟ කොන්දේසි:**

- ඉහත බයිත් දෙකක් එක්කොට නිර්මාණශීලී ඉසච්චක් ඉදිරිපත් කිරීම.
- බාලක තරග පමණකි.
- සිනමා ගීත අනුකරණය නොකල යුතුයි.
- පටිගත කළ ශබ්ද භාවිත නොකළ යුතුයි.
- ඇඳුම් හා ආභරණ ඉස්ලාමීය සංස්කෘතියට ගැළපෙන පරිදි විය යුතුයි.
- වේදිකාව පූර්ණ ලෙස භාවිතා කල යුතුවේ.
- සංගීත භාණ්ඩ ලෙස එක් පක්කිර් රබානක් පමණක් භාවිත කළ හැකිය.

ලකුණු ලබා දීමේ පිළිවෙළ : මර්හබා බයිත් (පිළිගැනීමේ ගීතය)

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | නිර්මාණාත්මක ඉදිරිපත් කිරීම. | 25 |
| 02 | ගායන හැකියාව සහ නිවැරදි උච්ඡාරණය | 25 |
| 03 | හැඟීම් හා කණ්ඩායම් ක්‍රියාකාරකම් | 20 |
| 04 | ගැළපෙන ඇඳුම් | 10 |
| 05 | වේදිකා භාවිතය | 10 |
| 06 | ප්‍රාසාංගික බව හා සමස්ථ නිමාව | 05 |
| 07 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

11. රිටි කෙළි කලාව : විවෘත බාලක (කණ්ඩායම්)

ශ්‍රී ලාංකික මුස්ලිම් සංස්කෘතික උත්සවයන්හිදී කන්දූරි (මහා දන්සල), මීලාදුන් නබි උත්සවයට යාම, විවාහ උත්සවයකදී මනමාලයා මගුල් පෝරුවට කැදවාගෙන යාම, යම් උත්සවයකදී ආරාධිත අමුත්තන් වේදිකාවට කැදවාගෙන යාම යනාදි අවස්ථාවන්හි දී ද සිදුකරනු ලබන සම්ප්‍රදායික සෞන්දර්ය කලා අංගයකි.

**මාතෘකාව** : එළිමහන් රංග භූමියේ හෝ වේදිකාව මත කරනු ලබන ඉදිරිපත් කිරීම.

**සහභාගී විය හැකි තරගකරුවන් සංඛ්‍යාව** : අවම 08 - උපරිම 10

**කාලය** : විනාඩි 07 – 08

තරග කොන්දේසි :

- අඟල් 12 ක දිගින් යුක්ත රිටි භාවිතා කළ යුතු වේ.
- ඉස්ලාමීය සංස්කෘතිය පිළිබිඹුවන ගැළපෙන ඇඳුම් පැළඳිය යුතුයි.
- රිටි කෙළි තරගය සඳහා සුදුසු ගීතයක් රිද්මයානුකූලව පසුබිම් සඳහා ගායනය කළ යුතුය.
- ගායක කණ්ඩායමට පොතේගුරු ඇතුලු අවම දෙදෙනෙක් හෝ උපරිම තුන් දෙනෙක් සහභාගි විය හැකිය.
- පටිගත කළ ශබ්ද භාවිත නොකළ යුතුයි.
- තරගයට ඉදිරිපත්වන අවස්ථාවේ ගී පද රචනය තරග සංවිධායකට ලබාදිය යුතුයි.

ලකුණු ලබා දීමේ පිළිවෙළ : රිටි කෙළි කලාව

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | ගායනයට ගැළපෙන රිද්මය | 25 |
| 02 | නර්තන මාරුව | 25 |
| 03 | සංවිධානය සහ සමමුහුර්තකරණය | 15 |
| 04 | තාලය | 10 |
| 05 | සාමූහික බව | 10 |
| 06 | ගැළපෙන ඇඳුම් | 10 |
| 07 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

12. අර් රක්සූර් රබාංනි (රබන් නර්තනය) : විවෘත බාලක (කණ්ඩායම්)

මාතෘකාව : "අපි රාමසාන් උත්සවය සමරමු"

සහභාගී විය හැකි තරගකරුවන් සංඛ්‍යාව : අවම 10 - උපරිම 12

කාලය : විනාඩි 05 – 06

තරග කොන්දේසි :

- තේමාවට ගැළපෙන ගී පද ස්වයං නිර්මාණයක් විය යුතුයි.
- ගීතය දෙමළ මාධ්‍යයෙන් විය යුතුයි.
- ගී පද කිසිවෙකුගේ හෝ හිත් රිදවන වචනවලින් සමන්විත නොවිය යුතුයි.
- සිනමා ගීත අනුකරණයක් නොවිය යුතුයි.
- සංගීත භාණ්ඩ ලෙස පක්කීර් රබන් පමණක් භාවිත කළ හැකිය.
- රබන් නර්තනය සඳහා තරගකරුවන් 8 හෝ 10 දෙනෙක් අත් රබන් සමඟ ද සංගීතය හා ගායනය සඳහා තරඟකරුවන් දෙදෙනෙක් (2) පක්කීර්වරු භාවිත කරන විශාල රබන් සමඟ ද සහභාගිවිය හැකිය.
- ඉස්ලාමීය සම්ප්‍රදායන්ට ගැළපෙන ඇඳුම් හා ආභරණ පැළඳිය යුතුයි.
- තරගය පවත්වන අවස්ථාවේ ගී පද රචනය තරග සංවිධායකට ලබාදිය යුතුයි.

ලකුණු ලබා දීමේ පිළිවෙළ : අර් රක්සූර් රබාංනි (රබන් නර්තනය)

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | තේමාවට ගැළපෙන ගී පද නිර්මාණය | 20 |
| 02 | ගීතයට ගැළපෙන නර්තනය | 20 |
| 03 | නර්තන කුසලතාවය | 20 |
| 04 | සාමූහික බව | 15 |
| 05 | ඇඳුම් පැළඳුම් | 10 |
| 06 | සමස්ත නිමාව හා කාලය | 15 |
| | එකතුව | 100 |

13. සමාජීය නාට්‍යය : විවෘත බාලිකා (කණ්ඩායම්)

මාතෘකාව : විසුරුණු පබලු

සහභාගී විය හැකි තරගකරුවන් සංඛ්‍යාව : අවම 06 - උපරිම 08

කාලය : විනාඩි 15 – 20

තරග කොන්දේසි :

- තේමාවට ගැළපෙන නිර්මාණය දෙමළ මාධ්‍යයෙන් විය යුතුයි.
- ස්වයං නිර්මාණයක් විය යුතුයි.
- ඉස්ලාමීය සම්ප්‍රදායට අනුකූල විය යුතුයි.
- පිළිගත් භාෂා ව්‍යවහාරයෙන් බැහැර නොවිය යුතු අතර සිනමා අනුකරණ නොකළ යුතුයි.
- වැඩසටහන අවසන් වන තෙක් තිරය වැසීම නොකළ යුතුයි.
- පිරිමි වෙස් නොගත යුතුයි.
- ඉස්ලාමීය සම්ප්‍රදායික ආභරණ පැළඳිය හැකිය.
- පසුබිම් සංගීතය සඳහා පටිගත කරන ලද සංගීතය භාවිත නොකළ යුතුයි.

- චරිත කිසිවෙකුගේ සිත් රිදවන ඒවා නොවිය යුතුයි.
- සංගීත භාණ්ඩ ලෙස එක් පක්කිර් රබානක් භාවිත කළ හැකිය.
- තරගයට ඉදිරිපත්වන අවස්ථාවේ දී නාට්‍යයේ තිර පිටපත තරග සංවිධායකට ලබාදිය යුතුයි.

**ලකුණු ලබා දීමේ පිළිවෙළ : සමාජීය නාට්‍යය**

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | නාට්‍ය තිර පිටපත නිර්මාණය හා අර්ථවත් ප්‍රකාශනය | 30 |
| 02 | වේදිකා නිර්මාණය | 10 |
| 03 | රංගන කුසලතාවය හා හැඟීම් ප්‍රකාශ කිරීම | 30 |
| 04 | චරිත සඳහා ගැළපෙන ඇඳුම් | 10 |
| 05 | උපාය | 15 |
| 06 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

**14. චීනාඩි ශාස්ත්‍රය : විවෘත බාලක (කණ්ඩායම්)**

විවාහ උත්සවයකදී මනමාලයා මගුල් පෝරුවට කැඳවාගෙන යන අවස්ථාවේ හෝ යම් උත්සවයකදී ආරාධිත අමුත්තන් වේදිකාවට කැඳවාගෙන යන අවස්ථාවේ සිදුකරන සම්ප්‍රදායික කලා අංගයකි.

**සහභාගී විය හැකි තරගකරුවන් සංඛ්‍යාව** : අවම 08 - උපරිම 10

**කාලය** : විනාඩි 07 – 08

**තරග කොන්දේසි :**

- ශරීරය ආවරණය වන පරිදි ලිහිල් ඇඳුමකින් සැරසී තලප්පාවක් පැළඳිය යුතුයි.
- ආචාර කිරීම අවශ්‍ය වේ.
- ප්‍රථම අඩිය - මුහුණදෙන දිශාව සහ වේගය එකම ස්ථානයෙන් විය යුතුයි.
- සිව් දිශාවම අවරණය වන පරිදි ක්‍රියාත්මක වීම.
- සෞන්දර්යාත්මක හැඟීම් ප්‍රදර්ශනය වන පරිදි අලංකරණ පියවර පමණක් ඉදිරිපත් කළ යුතුයි.
- තරගකරුවන් දෙදෙනෙකු අතර පියවර වෙනස් කිරීමේ (පැති මාරු කිරීමේ) අවස්ථාවන් සිදු කළ යුතුයි.
- කණ්ඩායම් අතරවූ පුට්ටු ක්‍රියාකාරකම් අන්තර්ගතව තිබිය යුතුයි.
- පසුබිම් සංගීතය සඳහා පටිගත කරන ලද සංගීත හඬපට භාවිත නොකළ යුතුයි.

**ලකුණු ලබා දීමේ පිළිවෙළ : චීනාඩි ශාස්ත්‍රය**

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | ආචාර කිරීම (ඉරියව් සැකසීම) | 20 |
| 02 | චක්‍රීය වර්ගයේ වේගවත් ප්‍රහාරය | 20 |
| 03 | දිශාවන් හා උපාය | 20 |
| 04 | අංග චලනයන් හා ඇඳුම් | 20 |
| 05 | අවසානය හා පරිපූර්ණ බව | 15 |
| 06 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

15. මැලේ සංස්කෘතික වැඩසටහන : විවෘත බාලක හෝ බාලිකා (කණ්ඩායම්)

මාතෘකාව : මැලේ සම්ප්‍රදායික පිහන් නර්තනය (තාරි පීරිංග්)

සහභාගී විය හැකි තරගකරුවන් සංඛ්‍යාව : අවම 08 - උපරිම 10

කාලය : විනාඩි 05 – 06

තරග කොන්දේසි :

- එක් පාසලකින් බාලක හෝ බාලිකා එක් කණ්ඩායමක් පමණක් සහභාගී විය යුතුයි.
- බාලක සහ බාලිකා තරග එකම ඉසව්වක් ලෙස පැවැත්විය යුතුයි.
- නර්තනය සහ ගීතය ඉස්ලාම් සංස්කෘතියට අනුකූල විය යුතුයි.
- නර්තනයට ගැළපෙන ගී පද ස්වයං නිර්මාණයක් විය යුතු අතර ගී පද මැලේ භාෂාවෙන් විය යුතුයි.
- නර්තනය සඳහා සෙරමික් පිහන් භාවිතා කළ යුතුයි.
- නර්තනය සඳහා තරඟකරුවන් 6 හෝ 8 දෙනෙක් ද පසුබිම් සංගීතය සඳහා තරඟකරුවන් දෙදෙනෙක් (2) ද සහභාගි විය යුතුයි.
- පසුබිම් සංගීතය සඳහා පක්කීර් රබන් පමණක් භාවිතා කළ හැකිය.
- ඉස්ලාම් සංස්කෘතියට ගැළපෙන ඇඳුම් හා ආභරණ පැළඳිය යුතුයි.
- කණ්ඩායම සඳහා මැලේ ජාතික ශිෂ්‍යයින් ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී පාසලේ ඉගෙනුම ලබන අනෙකුත් ශිෂ්‍යයින් සහභාගී කරගත හැකිය. නමුත් මැලේ ජාතික ශිෂ්‍යයින්ට ප්‍රමුඛත්වය ලබා දිය යුතුයි.
- තරගයට ඉදිරිපත්වන අවස්ථාවේ දී ගී පද රචනය තරග සංවිධායකට ලබාදිය යුතුයි.

ලකුණු ලබා දීමේ පිළිවෙළ : මැලේ සංස්කෘතික වැඩසටහන

| අංකය | විස්තරය | ලකුණු |
|---|---|---|
| 01 | ගීතය හා නර්තන නිර්මාණය | 30 |
| 02 | තාල පාලනය හා උපායන්, නිවැරදි උච්ඡාරණය | 20 |
| 03 | අලංකරණය සහ අංග චලනය | 20 |
| 04 | ගැළපෙන ඇඳුම් | 15 |
| 05 | අවසානය හා සම්පූර්ණ බව | 10 |
| 06 | කාලය කළමනාකරණය | 05 |
| | එකතුව | 100 |

**සටහන් :**

**තරගකරුවන්ට අරාබි භාෂාව ඉතා නිවරදිව උච්ඡාරණය කිරීම සඳහා අරාබි භාෂාවෙන් රචිත කසීදා, මර්හබා බයිත්, අරාබි ගීත මේ සමඟ අමුණා ඇත.**

**අධ්‍යාපන ලේකම්ගේ අත්සනින් ඉදිරිපත් කර ඇති අංක 47/2023 දරණ චක්‍රලේඛයේ කොන්දේසි වලට යටත්ව මෙම තරගයට ඉදිරිපත් විය යුතු බව දන්වමි.**

මේජර් එන්. ටී. නසුමුදීන්
අධ්‍යාපන අධ්‍යක්ෂ
මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

# ආදර්ශ අයදුම්පත

## සමස්ත ලංකා පාසල් මුස්ලිම් සංස්කෘතික තරගය - 2024

1. පාසලේ නම : ..................................................................................................

2. අධ්‍යාපන කලාපය :

3. පළාත :

4. තරග කාණ්ඩය :

5.

| අනු අංකය | තරග කාණ්ඩය | ශ්‍රේණිය | තරග අංකය | තරගයේ නම | කේවළ/ කණ්ඩායම් | ශිෂ්‍යාගේ නම | ස්ත්‍රී/ පුරුෂ බව | උපන් දිනය | අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

6. විෂයය භාර ගුරුභවතාගේ නම : අත්සන :
   දුරකථන අංකය : දිනය :

7. විදුහල්පතිගේ නම : අත්සන :
   දුරකථන අංකය :

   නිල මුද්‍රාව :

   දිනය :

# سبحان مولد

الحمد لله الذي أعطاني

هذا الغلام الطيب الأردان

قد ساد في المهد على الغلمان

أعيذه بالله ذي السلطان

حتى أراه بالغ البيان

أعيذه من شر ذي شنئان

من حاسد مضطرم العينان

أنت الذي سميت في القرآن

أحمد مكتوبا على الجنان

صلى عليك الله في الأحيان

أحمده في السر والإعلان

حقا على الإسلام والإيمان

صلى عليك خالق الجنان

ما دام أبد الرحمة الرحمان

Annex I

يا وجيه الدين والكرم

وحليف العلم والحكم

نبي نبي نبي نبي

نبي نبي نبي نبي

يا رسول الله سلام عليك

يا رفيع الشأن والدرج

رسول رسول رسول رسول

رسول رسول رسول رسول

يا وفي العهد والذمم

وحميد السعي والشيم

أمين أمين أمين أمين

أمين أمين أمين أمين

يا رسول الله يا عمدتنا

يا إمام الأنبياء الأمناء

خاتم خاتم خاتم خاتم

خاتم خاتم خاتم خاتم

والفقيد المحض معترف

منه بالإفلاس والعدم

رحيم رحيم رحيم رحيم

رحيم رحيم رحيم رحيم

غير أن الفضل معتقد

من عظيم الفضل والكرم

كريم كريم كريم كريم

كريم كريم كريم كريم

يا وجيه الدين والكرم

وحليف العلم والحكم

نبي نبي نبي

نبي نبي نبي

وصلاة الله خالقنا

تتغاشى سيد الأمم

مصطفى مصطفى مصطفى مصطفى

مصطفى مصطفى مصطفى مصطفى

أحمد المختار سيدنا

عدد الأوراق والديم

كامل كامل كامل كامل

كامل كامل كامل كامل

يا وجيه الدين والكرم

وحليف العلم والحكم

نبي نبي نبي

نبي نبي نبي

يا طيبة

يا طيبة .. يا دوا العيانا
اشتقنالك .. والهوى ناداك

لما سار المركب نساني
ساروا والدمع ما جفاني
أخذوا قلبي مع جناني
يا طيبة يا تيم الولهانا

قبلتي بيت الله صابر
علني يوما لك زائر
يا ترى هل تراني ناظر
للكعبة .. وتغمرني بأمانا

نبينا أغلى أمنياتي
أزورك لو مرة بحياتي
وبجوارك صلي صلاتي
واذكر ربي واتلو القرآنا

بشراك .. المدينة بشراك
بقدوم الهادي يا بشراك
فهل لي مأوى في حماك
أتملي .. فالنور سبانا
.. نوركم سبانا

يا طيبة يا طيبة .. يا دوا العيانا

Annex IV

## مولد الحرير

طلع البدر علينا

من ثنيات الوداع

وجب الشكر علينا

ما دعى لله داعي

أيها المبعوث فينا

جئت بالأمر المطاع

قد لبسنا ثوب عز

بعد تلفيق الرقاع

أنت في الكل جميل

وجمال يا مطاع

ورضعنا ثدي وصل

قبل أيام الرضاع

ربنا صل على من

حل في خير البقاع

وعلى آل وصحب

ما سعى لله ساع

واسبل الستر علينا

يا مجيبا كل داع

Annex V

## مولد شهداء البدريين

الصبح بدا من طلعته

والليل دجى من وفرته

فاق الرسلا فضلا وعلا

أهدى السبلا لدلاته

كنز الكرم مولى النعم

هادي الأمم لشريعته

أزكى النسب أعلى الحسب

كل العرب في خدمته

سعت الشجر نطق الحجر

شق القمر بإشارته

جبريل أتى ليلة إسرا

والرب دعاه لحضرته

نال الشرفا والله عفا

عما سلفا من أمته

فمحمدنا هو سيدنا

فالعز لنا لإجابته

وعليه صلوة الله ولا

آل وعلى بدريته

## سبحان مولد

يا نبي سلام عليكم
يا رسول سلام عليكم
يا حبيب سلام عليكم
صلوات الله عليكم

أشرق البدر علينا
فاختفت منه البدور
مثل حسنك ما رأينا
قط يا وجه السرور

يا حبيبي يا محمد
يا عروس الخافقين
يا مؤيد يا ممجد
يا إمام القبلتين

من رأى وجهك يسعد
يا كريم الوالدين
رب ارحمنا جميعا
بجميع الصالحات

# تلي فاتحة

لا إله إلا الله

لا إله إلا الله

لا إله إلا الله

محمد رسول الله

عدتي سلام عليك

عمدتي سلام عليك

أسوتي سلام عليك

فاطمة سلام عليك

مرحبا أم الحسين

مرحبا أم الحسن

مرحبا قرة عين

فاطمة سلام عليك

مرحبا بنت الرسول

مرحبا زوجة علي

مرحبا سيدة النساء

فاطمة سلام عليك

صلى الله على محمد

صلى الله عليه وسلم

صلى الله على محمد

صلى الله عليه وسلم

صلى الله على محمد

يا رب صل عليه وسلم

<u>අදාන් දුආ</u>

<u>அதான் துஆ</u>

" اللهم رب هذه الدعوة التامة، والصلاة القائمة، آت محمدا الوسيلة والفضيلة، وابعثه مقاما محمودا الذي وعدته"

Annex IX